සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	11	භූගෝල විද්‍යාව I	කාලය நேரம் Time	පැය 01 යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

- සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

1. සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක අතර ජීවීන් සිටින එකම ග්‍රහලෝකය ..... යි.
(අඟහරු / සිකුරු /පෘථිවිය)
2. වායුගෝලයේ සංයුතිය අනුව 21% ක් පමණ ඇත්තේ ..... වායුවයි.
(කාබන් ඩයොක්සයිඩ් / නයිට්‍රජන් / ඔක්සිජන්)
3. ශාක හා සත්වයින් ඇතුළත් නිරන්තර ක්‍රියාකාරිත්වයෙන් යුතු ජීවී පරිසරය ..... නමින් හැඳින්වේ. (ජෛව ගෝලය / ශිලා ගෝලය / වායුගෝලය)
4. ශ්‍රී ලංකාවට බහුලව බලපාන ස්වභාවික ආපදාව ..... යි.
(නියඟය / ගංවතුර / සුළි සුළං)
5. පිහන් ගඩොල් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා බෝල මැටි වැඩි වශයෙන් ..... ප්‍රදේශයේ ව්‍යාප්තව ඇත. (බදුල්ල / මීටියාගොඩ / දෙදියවල)

- අංක 6 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් 'නි' වටා ද වැරදි නම් 'වැ' වටා ද රවුමක් අඳින්න.


6. ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ කර්මාන්ත ශාලාව සපුගස්කන්ද ප්‍රදේශයේ පිහිටා ඇත. (නි / වැ)
7. යකඩ හා වානේ මූලික ලෝහ වර්ගයක් ලෙස ලොව සෑම රටක් ම විවිධ නිෂ්පාදන සඳහා යොදා ගනී. (නි / වැ)
8. ජපානය ලෝකයේ නැව් තැනීමේ කර්මාන්තයට මුලින් ම යොමු වූ රටකි. (නි / වැ)
9. සාගර පතුල්වල සිදුවන භූමිකම්පා සුනාමි තරංග කෙරෙහි බලපාන ප්‍රබල සාධකය වේ. (නි / වැ)
10. පෘථිවි කබොල නිර්මාණය වී ඇත්තේ බැසෝල්ට් පාෂාණවලිනි. (නි / වැ)

- අංක 11 සිට 16 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

11. පෘථිවි අභ්‍යන්තරයේ උණු ස්වභාවයෙන් පවතින මැග්මා සිසිල් වී ඝන වීමෙන් ..... පාෂාණ නිර්මාණය වේ.
12. වයස අවුරුදු 60ට වැඩි ජන සංඛ්‍යාවේ ප්‍රතිශතය ක්‍රමයෙන් ..... ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යුහය තුළ කැපී පෙනෙන ලක්ෂණයකි.
13. මුලුන්කාවිල් ..... ජල ද්‍රෝණියකට නිදසුනකි.
14. ලෝකයේ අක්ෂාංශීය ..... ව්‍යාප්තිය පදනම් කරගෙන ප්‍රධාන දේශගුණ කලාප තුනක් හඳුනාගෙන ඇත.

15. හග්ගල, රිටිගල හා ..... දැඩි ස්වභාවික රක්ෂිත ලෙස නම් කර ඇත.
16. පෘථිවි කබොල ප්‍රාවරණයෙන් වෙන්වන්නේ ..... අසත්කතියෙනි.

- අංක 17 සිට 20 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන් උපයෝගී කරගන්න. වර්ෂයක් තුළ A හා B යන නගර දෙකෙහි වර්ෂාපතනය හා උෂ්ණත්ව ව්‍යාප්තිය එම ප්‍රස්තාර දෙකෙහි පෙන්වා ඇත.



17. A නගරයේ උපරිම උෂ්ණත්වය වාර්තා වී ඇත්තේ ..... මාසයේ දී ය.
18. ..... මාසයේ දී B නගරයේ උපරිම වර්ෂාපතනය වාර්තා වී ඇත.
19. 100mm වඩා අධික වර්ෂාපතනයක් ලැබුණු මාස වැඩි සංඛ්‍යාවක් ඇත්තේ ..... නගරයේ ය.
20. A හා B නගර දෙකෙන් වියළි කලාපයේ පිහිටි නගරය විය හැක්කේ ..... නගරයයි.

- අංක 21 සිට 25 තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙළට අනුව 'ආ' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

21.

'අ'	'ආ'
යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථාන	රට
1. ෂන්ෂුවාන් ප්‍රදේශය	A. රුසියාව
2. යූරල් කලාපය	B. චීනය
3. ලැන්කැෂයර් ප්‍රදේශය	C. ඉන්දියාව
	D. එක්සත් රාජධානිය

(1) A, B, C (2) B, A, D (3) C, A, D (4) D, C, A (.....)

22.

'අ'	'ආ'
අපනයන ගම්මාන	අපනයන බෝග
1. රාජාංගනය	A. බුලත්
2. දඹදෙණිය	B. මිරිස්
3. කටුගම්පොල	C. කජු
	D. වී

(1) A, C, B (2) B, A, C (3) B, C, A (4) D, C, A (.....)

23.

‘අ’	‘ආ’
භූ ලක්ෂණය	දක්වන ලද ආකාරය
1. නිම්නය	A. සමාන පරතරයකින් විහිදුනු සමෝච්ච රේඛා
2. මඳ බෑවුම	B. කඳු මුදුන දෙසට විහිදුණු සමෝච්ච රේඛා
3. නෙරුව	C. වෘත්තාකාරව විහිදුනු සමෝච්ච රේඛා
	D. පහත බිම් දෙසට විහිදුණු සමෝච්ච රේඛා

(1) A, B, C (2) B, A, D (3) C, A, D (4) D, A, C (.....)

24.

‘අ’	‘ආ’
වායුගෝලීය ස්තර	පෘථිවි පෘෂ්ඨයේ සිට දුර
1. පරිවර්තී ගෝලය	A. 80km
2. මෙසෝ ගෝලය	B. 120km
3. තාප ගෝලය	C. 50km
	D. 20km

(1) A, B, C (2) C, A, D (3) D, B, A (4) D, A, B (.....)

25.

‘අ’	‘ආ’
මහාද්වීපය	ගංගාව
1. ආසියා	A. පරානා
2. දකුණු ඇමරිකා	B. යෙනිසි
3. අප්‍රිකා	C. නයිජර්
	D. ඩැනියුබ්

(1) B, A, C (2) B, D, C (3) C, A, D (4) D, A, B (.....)

- අංක 26 සිට 36 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.

26. ලෝකයේ විශාලතම විල ලෙස සලකන්නේ,
(1) ඊරි විල (2) සුපීරියර් විල (3) ටිටිකාකා විල (4) වික්ටෝරියා විල (.....)

27. පහත සඳහන් ඛනිජ සම්පත් අතුරෙන් ලෝහමය ඛනිජ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
(1) යපස්, තඹ, මැග්නීසියම් (2) යපස්, තඹ, සිලිකා
(3) මැග්නීසියම්, මිනිරන් (4) මැග්නීසියම්, තඹ, ඇපටයිට් (.....)

28. 1:50000 භූ ලක්ෂණ සිතියමක ඉහළ වට තීරුවේ ඇති තොරතුරු පමණක් දැක්වෙන පිළිතුරු තෝරන්න.
(1) සිතියමේ නම, සිතියම් වර්ගය, යාබද සිතියම්
(2) සිතියම් වර්ගය, සිතියමේ නම, සිතියම් අංකය
(3) සිතියම් වර්ගය, යාබද සිතියම්, පරිමාණය
(4) සිතියම් වර්ගය, සිතියම් අංකය, පරිපාලන මායිම් (.....)

29. ගෝලීය උණුසුම වැඩිවීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය මින් කවරක් ද?
(1) වායුගෝලයේ කාබන් මොනොක්සයිඩ් ප්‍රතිශතය ඉහළ යාම.
(2) වායුගෝලයේ අඩංගු මීතේන් ප්‍රමාණය ඉහළ යාම.
(3) වායුගෝලයේ ඔක්සිජන් ප්‍රමාණය ඉහළ යාම.
(4) වායුගෝලයේ කාබන්ඩයොක්සයිඩ් ප්‍රතිශතය ඉහළ යාම. (.....)

30. පිලිපීන් දූපත් ආශ්‍රිත මධ්‍යම පැසිපික් සාගරයේ දී සුළි සුළං හඳුන්වන්නේ කුමන නමකින් ද?
(1) විලිවිලීස් (2) ටයිෆූන් (3) බැගියෝ (4) හරිකේන් (.....)

31. විලකින් ආරම්භ වන ගංගාවක් වන්නේ මින් කුමක්ද?
(1) මරේඩාලිං (2) යූරල් (3) නයිල් (4) මිසිසිපි (.....)

32. ශ්‍රී ලංකාවේ වාර්ෂිකව නිර්යාත කරන රබර් ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවීමට ප්‍රධාන හේතුව වන්නේ,
(1) නිෂ්පාදන පිරිවැය වැඩිවීම නිසා මිල වැඩිවීම යි.
(2) දේශීය පරිභෝජනය වැඩිවීම යි.
(3) නිෂ්පාදනය කරන රබර් තත්ත්වයෙන් බාල වීම යි.
(4) කර්මාන්තය සඳහා ශ්‍රමය හිඟවීම යි. (.....)

33. ආසියා මහද්වීපයේ රටවල් අතරින් වැඩිම ජන සංඛ්‍යාවක් ජීවත් වන රට,
(1) චීනය (2) ජපානය (3) ඉන්දුනීසියාව (4) ඉන්දියාව (.....)

34. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයට අයත් ප්‍රදේශවලට ආවේණික පස් වර්ගයක් වන්නේ,
(1) දියලු පස ය. (2) රතු දුඹුරු ලැටසෝල් පස ය.
(3) රතු කහ ලැටසෝල් පස ය. (4) රතු දුඹුරු පස ය. (.....)

35. ලෝකයේ වැඩියෙන් ම නිෂ්පාදනය හා පරිභෝජනය කරන ධාන්‍ය වර්ගය,
(1) තිරිඟු ය. (2) බාර්ලි ය. (3) වී ය. (4) ඉරිඟු ය. (.....)

36. ශ්‍රී ලංකාවේ රබර්, පොල්, තේ විශාල වශයෙන් වගා කරන දිස්ත්‍රික්ක තුනක් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද?
(1) මාතර, තංගල්ල, බදුල්ල (2) කෑගල්ල, නුවරඑළිය, කුරුණෑගල
(3) කළුතර, මහනුවර, බදුල්ල (4) කෑගල්ල, කුරුණෑගල, නුවරඑළිය (.....)

- පහත A, B, C හා D වලින් දක්වා ඇති ප්‍රකාශ යුගල හොඳින් අධ්‍යයනය කොට අංක37 සිට 40 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. 1. පොසිල ඉන්ධන දහනය
2. වායු දූෂණය

B. 1. පාංශු බාදනය
2. කෘෂි අස්වැන්න

C. 1. සංක්‍රමණ
2. ජන සංඛ්‍යාව

D. 1. වායු පීඩනය
2. පරිසර දූෂණය

37. පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නේ අඩුවීමට හේතුවන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (.....)

38. දෙවැන්නේ අඩුවීම මෙන් ම වැඩිවීමට ද පළමුවැන්න හේතුවන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (.....)

39. පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නේ වැඩිවීමට හේතුවන බව දැක්වෙන මාතෘකා යුගලය කුමක්ද?
(1) A (2) B (3) C (4) D (.....)

40. පළමුවැන්න හා දෙවැන්න අතර සෘජු සම්බන්ධයක් නොදක්වන මාතෘකා යුගලය කුමක්ද?
(1) A (2) B (3) C (4) D (.....)

(ලකුණු 1x40=40)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade: 11 ශ්‍රේණිය	**භූගෝල විද්‍යාව II**	කාලය / நேரம் / Time: පැය 02 යි

නම / பெயர் / Name: ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.
- **I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතුයි.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

I කොටස

1) (අ) ඔබ වෙත සපයා ඇති 1:50000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.
අංක (i) සිට (iv) දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

(i) A අක්ෂරයෙන් දක්වා ඇති දුම්රිය මාර්ගය කුමක් ද?
(පුළුල් ඒකීය / පුළුල් ද්විත්ව / පටු)

(ii) B අක්ෂරයෙන් දක්වා ඇති සමෝච්ච රේඛාවේ අගය?
(120m / 100m / 80m)

(iii) C අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද?
(වැව / වැව් බැම්ම / බැම්ම)

(iv) D අක්ෂරයෙන් දක්වා ඇති මායිම කුමක් ද?
(පලාත් / දිස්ත්‍රික්ක / උපදිසාපති කොට්ඨාශ)

(v) අංක 1 කොටුකර ඇති ප්‍රදේශයේ ඇති පොදු සේවා සපයන ආයතනය කුමක්ද?

(vi) අංක 2 දක්වා ඇත්තේ කුමක්ද?

(vii) අංක 3 දක්වා ඇති ලක්ෂණය කුමක්ද?

- සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා බලා නිවැරදි නම් නි/√ යන ද, වැරදි නම් වැ/x යන්න ද පිළිතුරු පත්‍රයේ ඒ ඒ ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න.

(viii) ප්‍රදේශයේ වී වගාව සිදු කරනු ලබන්නේ වර්ෂා ජලයෙනි.

(ix) ප්‍රදේශයේ බහුලව වශයෙන් ලදු කැලෑ දැක ගත හැකිය.

(x) මෙම ප්‍රදේශය වියලි කලාපයට අයත් බව කිව හැකිය.

PAST PAPERS WIKI

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව දක්වා ඇති තීරුව යොදා ගන්න.

(i)	වොල්ගා ගඟ	A, B, C
(ii)	සුමාත්‍රා දූපත	D, E, F
(iii)	කඟ මුහුදු	G, H, J
(iv)	ඇට්ලස් කන්ද	K, L, M
(v)	ෆ්ලෝරිඩා අර්ධද්වීපය	N, O, P

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබදව දක්වා ඇති තීරුවේ කොටු යොදා ගන්න.

(i)	වැලිගම	A, B, C
(ii)	පුල්මුඩේ	D, E, F
(iii)	රත්නපුර දිස්ත්‍රික්කය	G, H, J
(iv)	මීගමුව	J, K, L
(v)	විල්පත්තු	M, N, O

II කොටස

2) (i) පෘථිවි ශිලාගෝලය බෙදනු ලබන කොටස් දෙක නම් කරන්න. (ල. 02)

(ii) ශිලා ගෝලයෙන් මානවයා ලබාගන්නා ප්‍රයෝජන තුනක් ලියන්න. (ල. 03)

(iii) a. පෘථිවියේ උප පද්ධති හතර නම් කරන්න. (ල. 02)


b. එම උප පද්ධති අතර පවත්නා අන්තර් සම්බන්ධතාවයන් තුනක් උදාහරණ සහිතව සඳහන් කරන්න. (ල. 03)

3) (i) ශිලා ගෝලයේ ඇති ප්‍රධාන භූතැටි දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) පහත A, B රටවල් අයත් වන භූ තැටි නම් කරන්න.

A - සුමාත්‍රා දූපත B - ග්‍රීන්ලන්තය (ල. 02)

(iii) a. රූප සටහනේ දක්වා ඇති A, B, C ස්ථාන පිළිවෙලින් නම් කරන්න. (ල. 03)



b. සාගර හා මුහුදු මිනිසා විසින් ප්‍රයෝජනයට ගන්නා අවස්ථා දෙකක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ල. 03)

4) (i) පාෂාණ උපත අනුව බෙදන කොටස් දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) ඉහත ඔබ නම් කළ එක් පාෂාණ වර්ගයකින් ලබාගන්නා ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) a. පස නිර්මාණයට බලපාන සාධක දෙකක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

b. පාංශු සංරක්ෂණයට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ල. 02)

5) (i) වතු කෘෂිකර්මාන්තය යනු කුමක්දැයි නිර්වචනය කරන්න. (ල. 02)

(ii) a. ආසියාවෙන් බැහැරව වී වගා කරන ප්‍රදේශ දෙකක් ලියන්න. (ල. 02)

b. ආසියාවේ වී වගා කරන ප්‍රදේශයක් නම් කරන්න. (ල. 01)

(iii) a. ආසියානු කලාපයේ වගා කරනු ලබන තේ වගාවේ වර්ධනයට බලපාන භෞතික සාධක දෙකක් නම් කරන්න. (ල. 02)

b. ලෝකයේ තේ වගාව ආශ්‍රිතව දැකිය හැකි ප්‍රවණතා දෙකක් නම් කර ඉන් එකක් තේ වගාවේ වර්ධනයට බලපාන අන්දම විස්තර කරන්න. (ල. 03)

6) (i) බලශක්තිය වශයෙන් හඳුන්වන්නේ කුමක්ද? (ල. 02)

(ii) ශ්‍රී ලංකාවේ පහත සඳහන් බල ශක්තීන් උත්පාදනය කරනු ලබන ස්ථාන එක බැගින් ලියන්න.

(a). සූර්ය ශක්තිය (b). පෙට්‍රෝලියම් (c). සුළං (ල. 03)

(iii) a. බලශක්ති පරිහරණයේ දී ඇතිවන ගැටළු දෙකක් නම් කරන්න. (ල. 02)

b. බල ශක්තිය අර පිරිමැස්සෙන් භාවිත කිරීමෙන් රටේ සංවර්ධනයට දායක විය හැකි ආකාර දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

7) (i) ලෝකයේ ස්වභාවික උපද්‍රව උපත ලබන ආකාරය අනුව බෙදනු ලබන කොටස් දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) ශ්‍රී ලංකාවේ නාය යෑම් ආපදාවට බලපානු ලබන

a). ස්වභාවික හේතු දෙකක් (ල. 02)

b). මානුෂ ක්‍රියාකාරකම් එකක් සඳහන් කරන්න. (ල. 01)

(iii) a. ලංකාවේ නිරතුරුවම ජලගැලීම් ආපදාවට භාජනය වන ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ල. 02)

b. ජලගැලීම් ආපදාව අවම කිරීමට ශ්‍රී ලංකා රජය මගින් මෑත කාලීනව ගෙන ඇති පියවර දෙකක් නම් කර ඉන් එකක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 03)

8) (i) ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම නිසා ඇතිවන දේශගුණික වෙනස්කම් දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට බලපාන

a). මානුෂ ක්‍රියාකාරකම් දෙකක් ද (ල. 02)

b). ස්වභාවික හේතු එකක් ද පිළිවෙලින් නම් කරන්න. (ල. 01)

(iii) a. හරිතාගාර වායු වර්ග හතරක් නම් කරන්න. (ල. 02)

b. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම නිසා ඇතිවන බලපෑම් තුනක් නම් කර ඉන් එකක් ගෝලීය උෂ්ණත්වය වැඩිවීමට බලපාන අන්දම විස්තර කරන්න. (ල. 03)

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

භූගෝල විද්‍යාව II

1). (අ).

(i) .....

(ii) .....

(iii) .....

(iv) .....

(v) .....

(vi) .....

(vii) .....


(viii) .....

(ix) .....

(x) .....

/10

(ආ)



(i) ☐

(ii) ☐


(iii) ☐

(iv) ☐

(v) ☐

☐/5

(ඉ)



(i) ☐

(ii) ☐

(iii) ☐

(iv) ☐

(v) ☐

☐/5

1. (අ) $\frac{\quad}{10}$ (ආ) $\frac{\quad}{10}$ (ඉ) $\frac{\quad}{10}$ = $\frac{\quad}{20}$

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	11	භූගෝල විද්‍යාව II / புவியியல் II	කාලය நேரம் Time

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....



Scale : 1:50000

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank